# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 10 ශ්‍රේණිය

**සිංහල සාහිත්‍ය රසාස්වාදය** **කාලය : පැය 03**

**I පත්‍රය**

උපදෙස්

- 1 පත්‍රය සඳහා පිළිතුරු මෙම පත්‍රයේ ම ලිවිය යුතුයි.
- 2 පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට වෙනම කඩදාසි භාවිත කරන්න.
- 1 පත්‍රය සඳහා ලකුණු 40 ක් ද 2 පත්‍රය සඳහා ලකුණු 60 ක් ද හිමි වේ.

- පහත 01,02 ප්‍රශ්න සඳහා ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

01) (1) සිට (5) තෙක් ඇති කොටස් කියවා ඒ ඇසුරෙන් අසා ඇති (අ.) (ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(1) "දේවයන් වහන්ස බිසවුන් වහන්සේ තනිව වැඩසිටි සෙයින් වැද්ද නො හෙමි'යි"

(අ) මේ ප්‍රකාශය කළේ කවරෙක්ද?

..............................................................................................................................

(ආ) බිසවුන් වහන්සේ යැයි රැවටුණේ කුමකට ද?

..............................................................................................................................

(2) " අහු උණිං අහු උණේ නෑ ඔහොම ගෑනියෙක්"

(අ) මෙම ප්‍රකාශය කළේ කවුද?

..............................................................................................................................

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් කෘතිය නම් කරන්න.

..............................................................................................................................

(3) රුදුරු ගිනි කඳක් ගත් සඳෙහි **වන'තුරු**

.........................................................

මිතුරු නැසීමට එම වෙයි **පසමිතුරු**

.........................................................

(අ) ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය වෙන වෙන ම ලියන්න.

(4) ‘‘නැගණියගේ රත් පැහැති සිඟිති මුවෙහි යටිතොල කෝපයෙන් දික් විය’’

(අ) නංගී කෝප වීමට හේතුව කුමක්ද?

..............................................................................................................................................

(ආ) මෙම කොටස ඇතුළත් ග්‍රන්ථය රචනා කළ ලේඛකයාගේ අවසාන ලේඛනය කුමක්ද?

.............................................................................................................................................

(5) ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ
දුක් දෙන අලි ඇතුන් පන්නා හරින්නේ
රැක්මෙන් දෙවියනේ වෙල බත් බුදින්නේ
දුප්පත්කම නිසයි මම පැල් රකින්නේ

(අ) මෙම කවිය කුමන අවස්ථාවක දී ගයනා කරන ලද්දක් ද?

..............................................................................................................................................

(ආ) පැරණි ගැමියා විවේකය විනෝදයෙන් හා අර්ථවත් ව ගත කිරීමට ගායනා කළ කවි විශේෂය කුමක්ද?

..............................................................................................................................................

0 2) පහත ගද්‍ය පද්‍ය කොටස් දෙකින් එක් කොටසකට පමණක් පිළිතුරු ලියන්න.

‘‘එබස් අසා කුස රජ්ජුරුවෝ උයනට ගොසින් මඟුල් පොකුණේ කරවටක් දියට බැස නෙලුම් පතකින් හිස වසා ගෙන නෙලුම් මලකින් මූණ වසා ගෙන සිටියාහු ය.බිසවුන් ප්‍රභාවතීන් උයනට කැඳවාගෙන ගොස් සවස් වේලෙයි පුෂ්පඵලපල්ලවයෙන් සඤ්චන්න වූ සපු දුනුකේ නා පනා සීනිද්ද්ද බෝලිද්ද දෑසමන් ආදී ගස් ලිය ද ගිරා බෝකල් ඈ පක්ෂීන් ද දක්වමින් මඟුල් උයන් ඇවිද ගෙන ඇගේ සිත් පොළඹමින් පොකුණු තෙරට ගියෝ ය.එකෙණෙහි ප්‍රභාවතී තොමෝ පස්පියුමෙන් ගැවසී ගත් පොකුණ දැක නහනු කැමතිව පිරිවර හා සමඟ පොකුණට බැස කෙළිමින් බෝධිසත්වයන් මූණ වසා ගෙන සිටි පියුමට අත දික් කළා ය.එකල්හි රජ්ජුරුවෝ නෙලුම්පත ඉවත්කොට ‘‘මම කුස රජය’’යි ප්‍රභාවතීන් අත ඇල්ලූ ය.ඔහුගේ මුඛය දැක ‘‘යක්ෂයෙක් මා අත අල්වා ගතැ’’යි මුරගාමින් හයින් මුර්ජාව ගියා ය.එසඳ රජ්ජුරුවෝ අත ඇරපී හ.ඉක්බිති බිසෝ සිහි ලදින් සිතන්නාහු ‘‘මා අත ඇල්ලුවෝ ඉදින් කුස රජ්ජුරුවෝ වී නම් ඇත්තල දි ඉලත්තියනුත් අස්සල දී අස්බෙටියෙනුත් මුන් විසින් ම ගසන ලදිමි.ඇතුගේ පශ්චිමාසනයෙහි ද මා වෙහෙසවූවෝත් මූ ම ය.

1.කුස රජ්ජුරුවෝ මඟුල් පොකුණේ සැඟව සිටියේ ඇයි? (ලකුණු 4 )

..............................................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................

2.මෙහි සඳහන් පරිදි පබාවතී බියට පත්වී සක ඇති කරගත් සිදුවීම් මොනවාද? (ලකුණු 4 )

..............................................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................

3.ජාතක කතාකරු පරිසරයේ සුන්දරත්වය දක්වා ඇත්තේ කෙසේ ද? (ලකුණු 6 )

.............................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................

4.ජාතක කතාකරු භාවිත කළ භාෂාව නිසා ඉතා හොඳින් මෙම අවස්ථාව පාඨක මනසේ චිත්‍රණය වන අයුරු පෙන්වන්න. (ලකුණු 6 )

.............................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................

**නැතහොත්,**

**ඉරට ඉරක් නැත මෙහෙම ඉරක් නැත ඉරිදා පායන ඉර වාගේ**

**සඳට සඳක් නැත මෙහෙම සඳක් නැත සඳුදා පායන සඳ වාගේ**

**දියට දියක් නැත මෙහෙම දියක් නැත කැලණි ගඟේ දියවර වාගේ**

**කෙතට කෙතක් නැත මෙහෙම කෙතක් නැත ගොයම් නෙලන මේ කෙත වාගේ**

**බෝඹු ඉදල දලු ලා දෝ නො ලා දෝ**

**කෙකටිය මලේ වක යා දෝ නො යා දෝ**

**කැලණි ගඟේ ඕරු යා දෝ නො යා දෝ**

**කළුගෙ නගා මෙහි ඒ දෝ නො ඒ දෝ**

**දොඩම් කපාලා ඇඹුල් තනාලා නාන්ඩ යන හැටි බලන් කලූ**

**සේලේ ඇඳලා නෙරිය තියාලා මිදුලේ සක්මන් කරයි කලූ**

**දහසක් දීලා වළලු තනාලා දෑතේ අත ලා බලයි කලූ**

**දුනුකේ මල සේ උළු ගෙයි ඇඳ පිට ඔළිඳ කෙළින සැටි බලන් කලූ**

**ලත් පමණට මැටි ඉඳි කරවා ගෙන**

**පත් බැඳලා කළගෙඩි තනවා ගෙන**

**අත් නෑරම කළගෙඩි තෝරා ගෙන**

**සිත් සතොසින් කළ පිඹින්ට වෙන වෙන**

**1.ජන කවිය පිළිබඳ අධ්‍යයනය කිරීම වැදගත් වන්නේ ඇයි? (ලකුණු 4 )**

..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

**2.මෙම කවි තුළින් හෙළිවන අතීත ජන ක්‍රීඩා 2 ක් සඳහන් කරන්න. (ලකුණු 4)**

..........................................................................................................................................
..........................................................................................................................................

**3. එකම කවිය තුළ එළිසම අලංකාරය ද අනුප්‍රාස අලංකාරය ද යෙදුණු හැඅවස්ථා සඳහා දී ඇති කවිවලින් උදාහරණ සපයන්න. (ලකුණු 6)**

..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

**4. "ඒ ඒ අවස්ථාවට උචිත පරිදි ජන කවියේ රිද්මය අපූරුවට ගළපා ඇත."ඉහත ජන කවි ඇසුරෙන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6)**

..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

# 11 -පත්‍රය

**සැලකිය යුතුයි,**

- **පළමු වැනි ප්‍රශ්නය ද 2,3,4,5 ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න දෙකක් ද ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**
- **මෙම පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට කඩදාසි භාවිත කරන්න.**

**1) පහත දී ඇති පැදි පෙළ කියවා දී ඇති ප්‍රකාශ උපයෝගී කොට ගෙන රසාස්වාදයක් ලියන්න.**

කුරිරු ගොර සපුන්ගේ දළ'ගෙහි විසය
මදුරු මැසි කැලන්ගේ තුඩ'ගෙහි විසය
රුදුරු නුහුසුවන්ගේ වල'ගෙහි විසය
නපුරු දුදනන්ගෙ සියල'ඟෙහි ම විසය

පරසිඳු පබු දනන් සෙවි පමණින් මහරු
බෙලෙනිඳු මඳ වුවත් නොකෙරෙති රුපුන් සරු
බරණිඳු ගෙල වසන න රද වෙමින් ගරු
ගුරුළිඳු අතින් ඇසි කිම යහළු තොරතුරු

නැණැති දනන් හට මඳ ගුණයක් කළ ද
පවතී ගල කෙටූ අකුරක් මෙන් නිබඳ
විමති දන හට කළ කිසි ගුණ නොමඳ
එනති වේය දිය පිට ඇඳි ඉරක් ලෙද

සඳු න් කපුරු සමඟින් පිනි දිය නොමඳ
සොඳින් කලල් කරමින් සුවඳ මුව මඳ
නිති න් හිම'ඹ ඉස ඉස ලූහුනු වැව්ව ද
තම න් ගුණය නොහරින වැනි දුදන හද

නොහිම් සුවඳ විහිදෙන කස්තුරි නිමල
උතුම් මුව නැබෙහිතැබ් බඹ නැණ විකල
විනම් මෙමට මහ බඹු පදවි යම් කල
තබම් බොරු කියන දුදනනගෙ දිව මුල

1.මෙම පැදි පෙළෙහි තේමාව

2.මෙම පද්‍යයන්හි කාව්‍ය ආකෘතිය නිර්මාණයෙහි සාර්ථකත්වයට බලපෑ ආකාරය

3.මිනිස් දුර්වලතා හාස්‍යයට ලක්කර ඇති ආකාරය

4.පැදි සඳහා භාවිත බස් වහරෙහි ලක්ෂණ

5.යොදාගෙන ඇති උපමාවල මනා ගැළපීම. (ලකුණු 6×5=30)

2.) කුස කුමරු තමන් හමුවේ ඇති අභියෝග ජයගැනීම සඳහා කටයුතු කළ ආකාරය නිදසුන් සහිත ව විස්තර කරන්න.

(ලකුණු 15)

3.) ළමා ලෝකය අපූරු ආකාරයට ප්‍රතිනිර්මාණය කරන්නට වෙසක් පහන කතුවරයා සමත් වී ඇත.නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

4.) තුංමංහන්දිය නවකතාවේ සිරිසේනගේ චරිතය ගැමි ජීවිතයේ ආස්වාදයත් ගැහැටත් එක ලෙස ම විඳි චරිතයකි.අදාළ අවස්ථා හා සිදුවීම් අසුරින් විමසන්න. (ලකුණු 15)

5.) ස්වභාදහම ඇසුරින් සුදන දුදන ගුණ පැහැදිලි කිරීමට සුභාෂිතය කතුවරයා දැක්වූ දක්ෂතාව අදාළ පැදි ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 15)